සැ. යු. : 2025.06.06 දින පළ කරන ලද අංක 2440 *ගැසට්* පත්‍රයේ II සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,441 - 2025 ජුනි මස 13 වැනි සිකුරාදා - 2025.06.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 1080 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 1086 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජූලි මස 04 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජුනි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ.බ.).

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1077- B 082690 — 5,403 (2025/06)
F 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබුවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

රත්නපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2025 ජුලි මස 14** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2025 මැයි මස 30 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| රත්නපුර | පැල්මඩුල්ල | පැල්මඩුල්ල කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා නවදුන් කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර |

06-80

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

05. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි.මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

06. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2025 ජූලි මස 14** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2025 මැයි මස 30 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කෑගල්ල | කෑගල්ල | කෑගල්ල නගර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල |

06-79

---

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**
**පුරප්පාඩු**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර** **පුරප්පාඩු සංඛ්‍යාව**

1. අධ්‍යක්ෂ තනතුරු :
   - 1.1 අධ්‍යක්ෂ - මත්ද්‍රව්‍ය නිවාරක, අධ්‍යාපන හා පුහුණු - (HM 1-1) -01
   - 1.2 අධ්‍යක්ෂ - පර්යේෂණ - (HM 1-1) -01

1.1 තනතුරු නාමය - අධ්‍යක්ෂ (මත්ද්‍රව්‍ය නිවාරක, අධ්‍යාපන හා පුහුණු)
සේවා ගණය - ජ්‍යෙෂ්ඨ කළමනාකාර -(HM 1-1)
පුරප්පාඩු ගණන - 01

අ. සුදුසුකම් :

අ.1 බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් -

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජීය විද්‍යාවන් යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සමඟ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පශ්චාත් උපාධියක් ලබා තිබීම;.

*සහ*

ප්‍රථම උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක/ව්‍යවස්ථාපිත ආයතනයක/මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ (MM 1-1) තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 13(දහතුන) ක පළපුරුද්දක් තිබීම.

අ.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් (පහත 1 හෝ 2)-

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහාවන සුදුසුකම් සපුරා තිබීම;

*හෝ*

2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි මධ්‍ය කළමනාකරණ සේවා ගණයෙහි (MM1-1) I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 03 (තුන) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සමඟ*

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.

ආ. *වයස :*
අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

ඇ. *වැටුප් කේත අංකය : HM 1-1*

ඈ. *මාසික වැටුප් පරිමාණය* : HM 1-1 ක.ච. 01/2025 (රු. 140,640 - 15 x 4,100 - රු. 202,140/-)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

***සැ.යු.-*** මෙයට අමතරව නිල වාහන හිමිකාරිත්වය ලබන අතර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 1/2015 (i) හා (ii) ප්‍රකාරව ඉන්ධන දීමනාව හා මෙයට අමතරව සන්නිවේදන දීමනා PED 2/2022 චක්‍රලේඛය අනුව හා වෘත්තීය දීමනාව ක.චක්‍රලේඛ 01/2025 අනුව ලබාදේ.

1.2 **තනතුරු නාමය : අධ්‍යක්ෂ - පර්යේෂණ :**
සේවා ගණය : ජ්‍යෙෂ්ඨ කළමනාකාර-HM 1-1
පුරප්පාඩු ගණන : 01

***අ. සුදුසුකම් :***

අ.1 බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජ වැඩ /සංඛ්‍යානය/ රසායන විද්‍යාව/ තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

*සමඟ*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

*සහ*

ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ (MM 1-1) තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 13 (දහ තුන) ක පළපුරුද්දක් තිබීම.

අ.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් (පහත 1 හෝ 2) :

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.;

*හෝ*

2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි මධ්‍ය කළමනාකරණ සේවා ගණයෙහි (MM1-1) I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 03 (තුන) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සමඟ*

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.

ආ. *වයස* :

අවුරුදු : 35ට නොඅඩු හා අවුරුදු : 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

ඇ. *වැටුප් කේත අංකය - HM 1-1* :

ඇ. *මාසික වැටුප් පරිමාණය* - HM 1-1 ක.ව. 01/2025 (රු. 140,640 - 15 x 4,100 -රු. 202,140/-)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමි වේ)

***සැ.යු.*** - මෙයට අමතරව නිල වාහන හිමිකාරිත්වය ලබන අතර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 1/2015 (i) හා (ii) ප්‍රකාරව ඉන්ධන දීමනාව හා මෙයට අමතරව සන්නිවේදන දීමනා PED 2/2022 චක්‍රලේඛය අනුව හා වෘත්තීය දීමනාව ක. චක්‍රලේඛ 01/2025 අනුව ලබාදේ.

**සියලු තනතුරු සඳහා පොදු කරුණු :**

සෑම අයදුම්කරුවෙකු ම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සෑම ආකාරයකින් ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍යය :**

සෑම අයදුම්කරුවෙකු ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත් යොමු කළ යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

බඳවා ගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත තරඟ විභාගයක හා/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

**පත්වීමේ ස්වභාවය;**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

**අයදුම්පත් ගාස්තුව :**

බාහිර අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ගාස්තුව වශයෙන් රු.500 ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් "අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය"නමින් ලංකා බැංකුවේ අංක 1643 යටතේ පවත්වාගෙන යන ගිණුමට බැර කර, මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතක් ඔබ ළඟ තබාගෙන එහි මුල් පිටපත (Deposit slip) අයදුම්පතට අමුණා එවිය යුතුය. අයදුම්පත් ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

ඔබගේ තොරතුරු "A4" ප්‍රමාණයේ පිටුවෙහි දෙපසම ප්‍රයෝජනයට ගනිමින් මණ්ඩලයේ වෙබ් පිටුවේ (www.nddcb.gov.lk) ඇති ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර (කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමඟ 2025.07.14 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයින් තම අයදුම්පත් ආයතන /දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් /අසම්පූර්ණ අයදුම්පත්/මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත අමුණා නොමැති අයදුම්පත්/ ආදර්ශ අයදුම්පත අනුව අයදුම් නොකල අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.

සභාපති,
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.

2025 ජුනි මස 13 වැනි දින,
අංක 383, කෝට්ටේ පාර,
රාජගිරිය.

06-99

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ**

**තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වන විවෘත තරග විභාගය - 2025**

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ අනුමත තනතුරු පවතින අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ තනතුරුවල පවත්නා පුරප්පාඩු 95ක් සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2025 ජූනි මස 16 වැනි සඳුදා දින ආරම්භ වන අතර 2025 ජූලි මස 11 වැනි දින පැය 21:00ට අවසන් වේ. එයින් පසුව ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**01.** මෙම විභාගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2025 සැප්තැම්බර් මස කොළඹදී පවත්වනු ඇත. රට තුළ උද්ගතවිය හැකි විශේෂ තත්ත්වයක් මත පමණක් විභාගය දිවයින පුරා පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එතකුදු වුවත් කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කර නොමැති අවස්ථාවකදී එම මධ්‍යස්ථානයට මනාපය පළ කර ඇති අයදුම්කරුවන් වෙනත් විභාග මධ්‍යස්ථානයකට යොමු කරනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට යටත්ව මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට විභාග කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත.

මෙම නිවේදනයේ "පත්වීම් බලධරයා" යනුවෙන් අදහස් කරනුයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

**02.** **බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත :**
ලිඛිත විභාගය සමත් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ ලකුණු කුසලතා අනුපිළිවෙළ හා මනාපය සැලකිල්ලට ගෙන බඳවා ගනු ලැබේ. එක් එක් තනතුරට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2.1 මනාපය සටහන් කිරීම :
එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමට තිබිය යුතු සුදුසුකම් සපුරා ඇත්නම් අයදුම්කරුවකුට තනතුරු කිහිපයකට අයදුම් කිරීමට හැකියාව ඇත. අයදුම්කිරීමේ දී අයදුම්කරුවන් විසින් එක් එක් තනතුර සඳහා තම මනාප අනුපිළිවෙළ අයදුම්පතේ සටහන් කළ යුතුය.

***සැලකිය යුතුයි*** : එක් තනතුරකට වඩා වැඩි ගණනකට අයදුම් කිරීමේදී අයදුම්කරු විසින් අයදුම්පතේ සටහන් කරනු ලබන මනාප අනුපිළිවෙළ පසුව සංශෝධනය කිරීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරු විසින් මනාපය සටහන් කර නොමැති තනතුරු සඳහා පත්වීම් ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම් කිසිදු කරුණක් මත සලකා බලනු නොලැබේ.

2.2 ලිඛිත විභාගය : මෙම තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40 |

2.2.1 විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය සහ තීරණ ගැනීමේ හැකියාව වැනි කරුණු නිශ්චය කිරීම සඳහා සකස් කරනු ලබන මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත වනු ඇත. |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද, ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු ද, ජාතික හා ජාත්‍යන්තර විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ඇති අවබෝධය ද පරීක්ෂා කිරීම සඳහා සකස් වූ සාමාන්‍ය දැනුම මැන බලන ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි. පළමු කොටස කෙටි ප්‍රශ්නවලින් සමන්විතය. ලකුණු 25 කි. දෙවන කොටස අර්ධ ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විතය. ප්‍රශ්න 8කින් 5කට පිළිතුරු සැපයිය යුතුය. ලකුණු 75 කි. |

2.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : සුදුසුකම් පරීක්ෂා කිරීමක් පමණක් සිදු කරන අතර ලකුණු ලබා දීමක් සිදු නොවේ.

ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත, එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% හෝ ඊට වඩා ලකුණු ලබා සමත් වූ අයදුම්කරුවන්ගේ ලකුණු කුසලතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් සනාථ කරන අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා පමණක් බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අතර, අයදුම්කරුවන්ගේ සුදුසුකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ.

2.4 එක් එක් තනතුරුවලට අදාළවන පරිදි අයදුම්පතේ සටහන් කර ඇති මනාපය හා ලිඛිත විභාගයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත එක් එක් තනතුර සඳහා පත්කිරීම් කරනු ලැබේ.

කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේදී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම්ලත් අපේක්ෂකයින් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවයක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයින් අතුරින් වැඩිදුර තෝරාගැනීමක් සිදු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. මෙම තෝරාගැනීමේ පටිපාටිය පහත පරිදි කොටස් දෙකකින් යුක්තය.

I. අපේක්ෂකයින්ගේ හැකියාව ඇගයීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය

II. කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණය

ලිඛිත පරීක්ෂණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පැවැත්වෙනු ඇත.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

මෙම තෝරාගැනීමේ පටිපාටියේ ව්‍යුහය හා අන්තර්ගතය පිළිබඳ වැඩිදුර තොරතුරු www.psc.gov.lk හි රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ පහත වෙබ් පිටුවේ පළ කර ඇත.

මුල් පිටුව ⟶ බාගත කිරීම් ⟶ ක්‍රියා පටිපාටි ⟶ විශේෂ තෝරා ගැනීමේ පටිපාටිය

2.5 එක් එක් තනතුර සඳහා පත්කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මකවන දිනය පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. අදාළ තනතුරු සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ සහ ලබා දී ඇති මනාපය තරයේම පදනම් කරමින් පත්වීම් සිදු කරනු ලැබේ. කිසියම් තනතුරක පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ නොපිරවීමට හෝ පුරප්පාඩුවලින් යම් කොටසක් පිරවීමට හෝ නොපිරවීමට හෝ පත් කිරීම් බලධරයාහට බලය ඇත.

**03. පුරප්පාඩු සංඛ්‍යාව : 95**

පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව එම තනතුරු අයත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු අනුව තවදුරටත් බෙදී ඇති ආකාරය මෙම නිවේදනයේ 6.2.2 හි අධ්‍යාපන සුදුසුකම් යටතේ දක්වා ඇත.

**04. බඳවා ගැනීමේ පොදු කොන්දේසි :**

4.1. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු නියමයන් හා කොන්දේසිවලට ද, අංක 1877/27 දරන 2014.08.28 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථා විධිවිධානවලට ද, අදාළ වන පරිදි දෙපාර්තමේන්තු නියෝගවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ මුදල් රෙගුලාසිවලට ද, අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීතිවලට ද (මින් මතුවට කාර්යය පටිපාටික රීති ලෙස හඳුන්වනු ලබන), එක් එක් තනතුරට අදාළ අනුමත බඳවා ගැනීමේ පටිපාටිවලට ද, ඉහත නියමයන්, කොන්දේසි, නියෝග, විධිවිධාන, රෙගුලාසි හා රීතිවලට දැනටමත් කර ඇති හෝ මින් මතු කරනු ලැබිය හැකි සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් අදාළ තනතුරේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

4.2. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරු යටත් විය යුතු වේ. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් කළින් කලට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

4.3. මෙම පත්වීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. සේවයට බඳවා ගෙන වසර තුනක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

4.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව තනතුරට බැඳී වසර තුනක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා/ රාජ්‍ය භාෂාවන්හි ප්‍රවීණතාව ලබා ගත යුතුය.

4.5. පත්වීම්ලාභියකු දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

4.6. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා/ හෝ පත් කරන ලද තනතුරක හෝ පත්කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට පත්වීම් බලධරයාට බලය ඇත.

**05. වැටුප් ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු:82150-10x 2400-8x 2940–17x 3900–රු.195970/- (SL–1–2025)

වන අතර එම වැටුප හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. එතෙක් ඉහත චක්‍රලේඛයේ උපලේඛන III අනුව වැටුප් ගෙවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයින් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමිවේ.

**06. බඳවා ගැනීමේ සුදුසුකම් :**

6.1 සාමාන්‍ය සුදුසුකම් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.

ii. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.

iii. ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මෙන්ම තම තනතුරේ භූමිකාව හා කාර්යයභාරය හොඳින් ඉටු කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

iv. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

v. කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන තැනැත්තකු නොවීම.

6.2 අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා වයස් සීමාව :

6.2.1 වයස් සීමාව : අයදුම්පත් කැඳවීමේ නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන දිනට වයස අවුරුදු විසි දෙක (22) ට නොඅඩු විය යුතු අතර අවුරුදු තිස්පහට (35) ට නොවැඩි විය යුතුය. ඒ අනුව, 2003.06.13 දිනට හෝ ඊට පෙර හා 1990.06.13 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම්කිරීමට සුදුසුකම් ඇත.

6.2.2 අධ්‍යාපන සුදුසුකම් :

| *අනු. අංකය* | *අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ | 05 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්-<br><br>(අ) පන්ති සාමාර්ථයක් සහිතව කෘෂිකර්මය හෝ උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>(ආ) උද්භිද විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක්;<br>සමඟ<br><br>පරිසර විද්‍යාව හෝ වන විද්‍යාව හෝ ශාක විවිධත්වය හෝ ජෛව විවිධත්ව හා සංරක්ෂණය හෝ උද්‍යාන විද්‍යාව හෝ භූමි අලංකරණවේදය හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ ශාක ආරක්ෂණය අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම;<br>හෝ<br>(ඇ) උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක්;<br>*සමඟ*<br><br>පරිසර විද්‍යාව හෝ වන විද්‍යාව හෝ ශාක විවිධත්වය හෝ ජෛව විවිධත්ව හා සංරක්ෂණය හෝ උද්‍යාන විද්‍යාව හෝ භූමිඅලංකරණවේදය හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ ශාක ආරක්ෂණය අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |

| අනු. අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 02 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ | 02 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්-<br><br>(අ) පන්ති සාමර්ථ්‍යයක් සහිතව සත්ත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික සත්ත්ව විද්‍යාව හෝ පශු පාලනය හෝ ජලජ සම්පත් කළමනාකරණය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>(ආ) සත්ත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික සත්ත්ව විද්‍යාව හෝ පශු පාලනය හෝ ජලජ සම්පත් කළමනාකරණය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක්;<br>*සමඟ*<br>සත්ත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික සත්ත්ව විද්‍යාව හෝ පශු පාලනය හෝ ජලජ සම්පත් කළමනාකරණය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>(ඇ) සත්ත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික සත්ත්ව විද්‍යාව හෝ පශු පාලනය හෝ ජලජ සම්පත් කළමනාකරණය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක්;<br>සමඟ<br><br>සත්ත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික සත්ත්ව විද්‍යාව හෝ පශු පාලනය හෝ ජලජ සම්පත් කළමනාකරණය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 03 | මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා සහකාර අධ්‍යක්ෂ | 06 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>භෞතික විද්‍යාව හෝ පරිගණක භෞතික විද්‍යාව හෝ ඉංජිනේරු භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම. |

| *අනු. අංකය* | *අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
| --- | --- | --- | --- | --- |
| 04 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | කාලගුණ විද්‍යාඥ | 06 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>*(අ)* භෞතික විද්‍යාව හෝ ගණිතය පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>*(ආ)* දෙවන පන්තියේ ඉහළ හෝ ඊට වඩා වැඩි පන්ති සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව හෝ ගණිතය විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>*(ඇ)* භෞතික විද්‍යාව හෝ ගණිතය විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ භෞතික විද්‍යාව හෝ ගණිතය හෝ පරිගණක විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 05 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | සහකාර වන සංරක්ෂක (වන කළමනාකරණ) | 05 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>*(අ)* පන්ති සාමාර්ථයක් සහිතව උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ශාක ජෛව විද්‍යාව හෝ ව්‍යවහාරික උද්භිද විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ පරිසර විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හා ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ පරිසර කළමනාකරණය හා වන විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>*(ආ)* උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ශාක ජෛව විද්‍යාව හෝ ව්‍යවහාරික උද්භිද විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව සහ කළමනාකරණය හෝ පරිසර විද්‍යාව;<br><br>*හෝ* |
| 06 | | සහකාර වන සංරක්ෂක (පර්යේෂණ ) | 01 | |

| *අනු. අංකය* | *අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 07 | | සහකාර වන සංරක්ෂක (අධ්‍යාපන) | 02 | පාරිසරික විද්‍යාව හා ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ පරිසර කළමනාකරණය හා වන විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් සමඟ උද්භිද විද්‍යාව<br><br>*හෝ*<br><br>ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ශාක ජෛව විද්‍යාව හෝ ව්‍යවහාරික උද්භිද විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ පරිසර විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හා ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ පරිසර කළමනාකරණය හා වන විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>*(ඇ)* උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ශාක ජෛව විද්‍යාව හෝ ව්‍යවහාරික උද්භිද විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ පරිසර විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හා ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ පරිසර කළමනාකරණය හා වන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ශාක ජෛව විද්‍යාව හෝ ව්‍යවහාරික උද්භිද විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ පරිසර විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හා ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ පරිසර කළමනාකරණය හා වන විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 08 | සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | රසඥ | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>*(අ)* රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>*(ආ)* පන්ති සාමර්ථයක් සහිතව රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ ආහාර විද්‍යාව හා තාක්ෂණය හෝ ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණය හෝ ආහාර විද්‍යාව හා නිෂ්පාදනය හෝ විශ්ලේෂණ රසායන විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |

| අනු. අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 09 | | කීට විද්‍යාඥ | 06 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්, -<br>*(අ)* සත්ත්ව විද්‍යාව හෝ ව්‍යවහාරික සත්ත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>*(ආ)* පන්ති සාමර්ථ්‍යයක් සහිතව සත්ත්ව විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ සත්ත්ව විද්‍යාව හෝ කීට විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 10 | | විද්‍යාත්මක නිලධාරී | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br>*(අ)* රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>*(ආ)* පන්ති සාමර්ථ්‍යයක් සහිතව රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 11 | | භෞතික විද්‍යාඥ | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br>පන්ති සාමර්ථ්‍යයක් සහිතව භෞතික විද්‍යාව හෝ ඉංජිනේරු භෞතික විද්‍යාව හෝ පරිගණක භෞතික විද්‍යාව හෝ ගණිතමය භෞතික විද්‍යාව හෝ ව්‍යවහාරික භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම. |

| *අනු. අංකය* | *අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 12 | | ජීව රසඥ | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>*(අ)* රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>*(ආ)* පන්ති සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යාව හෝ විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හෝ සායනික ජීව රසායන විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 13 | | පර්යේෂණ නිලධාරී (එන්නත් හා නිෂ්පාදන) | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>*(අ)* ප්‍රතිශක්ති විද්‍යාව හා ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ප්‍රතිශක්ති විද්‍යාව හා ඒකාබද්ධ අණුක ජීව විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ සත්ත්ව විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව හා ජීව රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>*(ආ)* පන්ති සාමාර්ථයක් සහිතව ප්‍රතිශක්ති විද්‍යාව හෝ ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ප්‍රතිශක්ති විද්‍යාව හා ඒකාබද්ධ අණුක ජීව විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ සත්ත්ව විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ ප්‍රතිශක්ති විද්‍යාව හා ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ප්‍රතිශක්ති විද්‍යාව හා ඒකාබද්ධ අණුක ජීව විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ සත්ත්ව විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව හා ජීව රසායන විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |

| අනු. අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 14 | | පර්යේෂණ නිලධාරි (ජීව රසායන විද්‍යා) | 02 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>(අ) ජීව රසායන විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>(ආ) පන්ති සාමාර්ථයක් සහිතව ජීව රසායන විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක්;<br><br>*සමඟ*<br><br>රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 15 | | පර්යේෂණ නිලධාරි (අණුක ජීව විද්‍යා) | 04 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>(අ) අණුක ජීව විද්‍යාව හා ජීව රසායන විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ජෛව තොරතුරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>(ආ) පන්ති සාමාර්ථයක් සහිතව අණුක ජීව විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ ජෛව තාක්ෂණය හෝ ජීව රසායන විද්‍යාව හෝ ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ජෛව තොරතුරු විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක්;<br><br>*සමඟ*<br><br>අණුක ජීව විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ ජෛව තාක්ෂණය හෝ ජීව රසායන විද්‍යාව හෝ ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ජෛව තොරතුරු විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |

| අනු. අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 16 | | පර්යේෂණ නිලධාරී (බැක්ටීරියා හා වෛරස්වේදී) | 02 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>(අ) ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ අණුක ජීව විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ අණුක ජීව විද්‍යාව හා ජීව රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>(ආ) පන්ති සාමාර්ථයක් සහිතව ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ අණුක ජීව විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ අණුක ජීව විද්‍යාව හා ජීව රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ අණුක ජීව විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ අණුක ජීව විද්‍යාව හා ජීව රසායන විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 17 | ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක | 16 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්,<br><br>පන්ති සාමර්ථ්‍යයක් සහිතව රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම. |
| 18 | | සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ සහකාර පරීක්ෂක | 04 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>(අ) පන්ති සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>(ආ) රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක්;<br><br>*සමඟ*<br><br>රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව යන විෂයයන් අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |

| අනු. අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | හෝ<br><br>(ඈ) ජීව විද්‍යා හෝ භෞතික විද්‍යා අංශයෙන් අධ්‍යාපන පොදු සහතිකපත් උසස් පෙළ සාමර්ථ්‍යයක්;<br><br>සමඟ<br><br>පන්ති සාමර්ථ්‍යයක් සහිතව පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>හෝ<br><br>(ඇ) ජීව විද්‍යා හෝ භෞතික විද්‍යා අංශයෙන් අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ සාමර්ථ්‍යයක් සමඟ පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 19 | කම්කරු දෙපාර්තමේන්තුව | පර්යේෂණ නිලධාරි | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>(අ) පන්ති සාමර්ථ්‍යයක් සහිතව රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>හෝ<br><br>(ආ) රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් සමඟ කාර්මික රසායන විද්‍යාව හෝ වෘත්තීය ස්වස්ථතාව හෝ පාරිසරික විද්‍යාව හෝ විෂ විද්‍යාව හෝ බහු අවයවික විද්‍යාව හා කාර්මික රසායන විද්‍යාව හෝ කාර්මික හා පාරිසරික රසායන විද්‍යාව හෝ කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ කාර්මික කාබනික රසායන විද්‍යාව හෝ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව හෝ බහු අවයවික විද්‍යාව හා තාක්ෂණය හෝ විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ ව්‍යවහාරික කාබනික රසායන විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම;<br><br>හෝ<br><br>(ඇ) රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමග කාර්මික රසායන විද්‍යාව හෝ වෘත්තීය ස්වස්ථතාව හෝ පාරිසරික විද්‍යාව හෝ විෂ විද්‍යාව හෝ බහු අවයවික විද්‍යාව හා කාර්මික රසායන විද්‍යාව හෝ කාර්මික හා පාරිසරික රසායන විද්‍යාව හෝ කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ කාර්මික කාබනික රසායන විද්‍යාව හෝ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව හෝ බහු අවයවික විද්‍යාව හා තාක්ෂණය හෝ විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ ව්‍යවහාරික කාබනික රසායන විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |

| *අනු. අංකය* | *අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 20 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | 02 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>(අ) පන්ති සාමාර්ථයක් සහිතව උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>(ආ) උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් සමඟ උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ ජෛවමිතිය අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>(ඇ) උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ ජෛවමිතිය අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |

| අනු. අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 21 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) | 09 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>(අ) පන්ති සාමාර්ථයක් සහිතව උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>හෝ<br><br>(ආ) උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් සමඟ උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ ජෛවමිතිය අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම;<br><br>හෝ<br><br>(ඇ) උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව සහ කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ ජෛවමිතිය අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 22 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (මානව වංශ විද්‍යා) | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පන්ති සාමාර්ථයක් සහිතව පුරාවිද්‍යාව හෝ ඉතිහාසය පිළිබඳ වසර හතරක (04) විශේෂ/ ගෞරව හෝ ඊට ඉහළ උපාධියක් ලබා තිබීම. |

| අනු. අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 23 | | සහකාර අධ්‍යක්ෂ (මානව විද්‍යා) | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br>පන්ති සාමාර්ථයක් සහිතව මානව විද්‍යාව හෝ සමාජ විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විශේෂ/ ගෞරව හෝ ඊට ඉහළ උපාධියක් ලබා තිබීම. |
| 24 | | සහකාර අධ්‍යක්ෂ (කීට විද්‍යා) | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br>පන්ති සාමාර්ථයක් සහිතව සත්ත්ව විද්‍යාව හෝ ව්‍යවහාරික සත්ත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හෝ ව්‍යවහාරික විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හා ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ පාරිසරික සංරක්ෂණය හා කළමනාකරණය හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම |
| 25 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ | 05 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>(අ) පන්ති සාමාර්ථයක් සහිතව උද්භිද විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ පරිසර විද්‍යාව හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ වන විද්‍යාව හෝ පරිසර සංරක්ෂණය හා කළමනාකරණය හෝ වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණය හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br><br>හෝ<br><br>(ආ) උද්භිද විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ පරිසර විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ වන විද්‍යාව හෝ පරිසර සංරක්ෂණය හා කළමනාකරණය හෝ වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණය හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ කෘෂිකර්ම විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් සමඟ වනජීවී සංරක්ෂණය හෝ වනජීවී කළමනාකරණය හෝ වන විද්‍යාව හෝ පරිසර විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය |

| අනු. අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ පරිසර සංරක්ෂණය හා කළමනාකරණය හෝ වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණය හෝ අනුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම;<br><br>හෝ<br><br>(ඇ) උද්භිද විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ පරිසර විද්‍යාව හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ වන විද්‍යාව හෝ පරිසර සංරක්ෂණය හා කළමනාකරණය හෝ වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණය හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ වනජීවී සංරක්ෂණය හෝ වනජීවී කළමනාකරණය හෝ වන විද්‍යාව හෝ පරිසර විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ශාක ජෛව විද්‍යාව හෝ ශාක විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ පරිසර සංරක්ෂණය හා කළමනාකරණය හෝ වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණය හෝ අනුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 26 | පේෂකර්ම දෙපාර්තමේන්තුව | පේෂකර්ම තාක්ෂණ විද්‍යාඥ | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>(අ) පන්ති සාමාර්ථයක් සහිතව පේෂ කර්මාන්ත තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>(ආ) පන්ති සාමර්ථ්‍යයක් සහිතව පේෂ කර්මාන්ත මෝස්තර නිර්මාණය පිළිබඳ නිර්මාණවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>(ඇ) පන්ති සාමර්ථ්‍යයක් සහිතව භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් සමඟ ක්ෂේත්‍රයේ විධායක මට්ටමක තනතුරක වසර තුනක පළපුරුද්ද ලබා තිබීම; |

| *අනු. අංකය* | *අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | | *හෝ*<br>(ඇ) භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් සමඟ පේෂකර්ම තාක්ෂණය හෝ නිර්මාණකරණය හෝ කර්මාන්ත කළමනාකරණය අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 27 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | භූ ගර්භ විද්‍යාඥ | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>(අ) භූ ගර්භ විද්‍යාව හෝ භූ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>(ආ) භූ ගර්භ විද්‍යාව හෝ භූ විද්‍යාව පිළිබඳ සාමාන්‍ය උපාධියක් සමඟ එම ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 28 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | රසායන විද්‍යාඥ | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>(අ) පන්ති සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>(ආ) රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සමඟ පශ්චාත් උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>(ඇ) රසායන විද්‍යාව විෂයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් සමඟ පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 29 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | විද්‍යාත්මක නිලධාරී (කෘෂි) | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්-<br>(අ) පන්ති සාමාර්ථයක් සහිතව කෘෂි විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br><br>(ආ) කෘෂි විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සමඟ කෘෂි විද්‍යා ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>(ඇ) උද්භිද විද්‍යාව හෝ වන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමග කෘෂි විද්‍යා ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |

| *අනු. අංකය* | *අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 30 | | විද්‍යාත්මක නිලධාරී (රසායන) | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්-<br>*(අ)* පන්ති සාමර්ථ්‍යයක් සහිතව රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>*(ආ)* පන්ති සාමර්ථ්‍යයක් සහිතව රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>*(ඇ)* රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමග ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 31 | | විද්‍යාත්මක නිලධාරී (ඖෂධ නවීකරණ) | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br>*(අ)* පන්ති සාමර්ථ්‍යයක් සහිතව ඖෂධවේදී හෝ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>*(ආ)* ඖෂධවේදී හෝ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් සමඟ පශ්චාත් උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>*(ඇ)* රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමග ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 32 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | සහකාර පස් රසඥ | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br>*(අ)* රසායන විද්‍යාව හෝ ව්‍යවහාරික රසායන විද්‍යාව හෝ රසායනික තාක්ෂණය හෝ කෘෂිකර්මය හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>*(ආ)* රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමඟ විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ කෘෂි ඉංජිනේරු විද්‍යාව හෝ පාංශු විද්‍යාව හෝ කෘෂි තාක්ෂණය හා කළමනාකරණය හෝ කෘෂි ව්‍යාපාර කළමනාකරණය හෝ කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම; |

| අනු. අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 33 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | සහකාර අධ්‍යක්ෂ | 02 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් -<br><br>(අ) පන්ති සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ ජෛව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>(ආ) රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>(ඇ) භෞතික විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ භෞතික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම. |

**7. විභාග කොන්දේසි :**

7.1 විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. අපේක්ෂකයින් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයින් මෙම විභාගය සඳහා තමා විසින් අයදුම්කරනු ලබන තනතුරුවලට අදාළ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර ඒ සඳහා එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

7.2 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරනලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම්කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instruction) භාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. මාර්ගගතව යොමු කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගෙන එහි අයදුම්කරුගේ අත්සන සහතික කිරීම සහ රාජ්‍ය/ පළාත් රාජ්‍ය/ රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ පරිදි ආයතන ප්‍රධානියාගේ සහතිකය ද සටහන් කරගෙන ළඟ තබා ගත යුතුය. එම සහතික කරන ලද මුද්‍රිත පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත කැඳවන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු වේ. අයදුම්පතේ පිටපතක් ලබා ගැනීම සඳහා පසුව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

7.3 මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 1200/= කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණයකාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the facility of internet transaction)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking method of bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

**සටහන :** ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් www.doenets.lk වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග

ගාස්තුව සඳහා වන නියමිත මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් මත ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ කරනු නොලැබේ.

7.4 අයදුම්කරු ළඟ තබා ගන්නා අයදුම්පතේ මුද්‍රිත පිටපතෙහි සහ විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. රජයේ සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථාවක සේවය කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසල් ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු/ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, රජයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකියයුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

7.5 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර අයදුම්කරුට ඒ පිළිබඳව කෙටි පණිවිඩයක් මඟින් දැනුම් දෙනු ලැබේ. ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ මුද්‍රිත පිටපත හා ගෙවීම් විස්තර සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

**සටහන :** ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය පමණි. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකමක් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

7.6 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

7.7 විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත ;

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;

iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරුකර ගත හැකි වන පරිදි සහ විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන්ව ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**08. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමකින් යටපත් කර ඇති බව පත්වීම් ලබා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ පත්වීම අවලංගු කරන අතර අදාළ පත්වීම යටතේ වැටුප් හා දීමනා ලෙස රජය/ පළාත් සභා විසින් ගෙවා ඇති සියලු මුදල් අයකර ගනු ලැබේ.

**09. විභාග මාධ්‍යය :**

i. විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යන්ගෙන් පවත්වනු ලැබේ.
ii. විභාගයට පෙනී සිටින මාධ්‍ය පත්වීම් මාධ්‍ය ලෙස සලකනු ලැබේ.
iii. අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
iv. තම අයදුම්පතෙහි සඳහන් විභාග භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

**10.** මෙහි විධිවිධාන සලසා නොමැති කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පත්කිරීම් බලධරයා සතු වේ.

**11.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්. ආලෝකබණ්ඩාර**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 ජුනි මස 09 වැනි දින.

06-98

---

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ
අධිකරණ යතුරු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

01. අංක 2088/26 දරන 2018.09.11 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025 සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **කොළඹ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වරයාට බලය ඇත.

**02. සේවා කොන්දේසි :**

2.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව බඳවාගනු ලබන අධිකරණ යතුරු ලේඛක සේවයේ නිලධරයන් ආයතන සංග්‍රහයට, මුදල් රෙගුලාසිවලට, අධිකරණ

සේවා කොමිෂන් සභාව විසින් දැනටමත් නිකුත් කර ඇති සහ කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ, නියෝග සහ විධානයන්ට යටත් වන්නේය.

2.2 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට බඳවා ගෙන වසර 05 ක් ගත වීමට පෙර සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

2.3 තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත්කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට බලය ඇත.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුකූලව නිකුත් කරන ලද අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 456 පරිදි උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල/දෙමළ /ඉංග්‍රීසි) III ශ්‍රේණියට අදාළ ද්විතීක මට්ටම අනුව තනතුරට බැඳී වසර 03 ක් ඇතුළත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා 2025.03.25 දිනැති චක්‍රලේඛය අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට අදාළ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

වැටුප් කේතය - (MN 2-2025)
වැටුප් පරිමාණය (මාසිකව) - රු.48,470/- 10 x 540 – 11 x 630 – 10 x 1010 – 10 x 1190 - රු.82,800/-

අධිකරණ යතුරු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට බඳවාගනු ලබන අයදුම්කරුවන් රු.48,470/ක ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ලබන අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා 2025.03.25 දිනැති චක්‍රලේඛයේ උපලේඛන III පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.**

විශ්‍රාම වැටුප් සහිත බව ඉහතින් දක්වා තිබුණ ද අනාගතයේ බඳවාගනු ලබන අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට පත්වන නිලධාරින් සම්බන්ධයෙන් ඔවුන්ට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය හා/හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඉදිරියේ දී ගනු ලබන තීරණයකට ඔවුන් යටත් වන්නේය.

**05. සුදුසුකම්:**

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල/ දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) **2025.06.13** දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(I) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී ගණිතය ඇතුළු විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම (අධිකරණ යතුරු ලේඛක (සිංහල) තනතුරට අයදුම් කරන අයදුම්කරුවන්ට සිංහල භාෂාව සඳහා ද, අධිකරණ යතුරු ලේඛක (දෙමළ) තනතුරට අයදුම් කරන අයදුම්කරුවන්ට දෙමළ භාෂාව සඳහා ද, අධිකරණ යතුරු ලේඛක (ඉංග්‍රීසි) තනතුරට අයදුම් කරන අයදුම්කරුවන්ට ඉංග්‍රීසි භාෂාව සඳහා ද සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.)

සහ

(II) ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල හෝ රජයේ ලියාපදිංචි පුහුණු ආයතනයක යතුරු ලියනය පාඨමාලාවක් හෝ යතුරු ලියනය ද විෂයක් වශයෙන් ඇතුළත්ව ඇති පරිගණක පාඨමාලාවක් සාර්ථකව හදාරා ඉන් සමත්ව තිබීම

(ඉ) උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බඳවා ගනු ලබන සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

සැ.යු - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් **2025 ජුනි මස 13** වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

**06. විභාග පටිපාටිය :**

විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් (03) යුක්ත වේ.

| | ප්‍රශ්න පත්‍රය | මුළු ලකුණු | සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු |
|---|---|---|---|
| 01 | භාෂා හැකියාව (සිංහල/දෙමළ) | 100 | 40 |
| 02 | අභියෝග්‍යතාවය (සිංහල/දෙමළ) | 100 | 40 |
| 03 | යතුරු ලියනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | 100 | * |

(* පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන 'යතුරු ලියනය' විෂයයේ සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභිමතය අනුව තීරණය කරනු ඇත.)

මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයෙකුට තමන් කැමති එක් මාධ්‍යයකින් පමණක් විභාගයට පෙනී සිටිය හැක.

අයදුම්කරු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන් පමණක් "භාෂා හැකියාව" හා "අභියෝග්‍යතාව" යන ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සැපයිය යුතුය.

'යතුරු ලියනය' සඳහා තමන් අයදුම් කරන තනතුර අනුව ප්‍රශ්න පත්‍රය තෝරා ගත යුතුය. රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයා සතු සුදුසුකම හා හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.

**විභාගය සඳහා වන විෂය නිර්දේශය ;**

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | භාෂා හැකියාව (සිංහල/ දෙමළ) | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, ලිපි කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර සහ වගු සකස් කිරීම , දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| 02 | අභියෝග්‍යතාවය (සිංහල/ දෙමළ) | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ. |

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| 03 | යතුරු ලියනය (සිංහල/ දෙමළ/ඉංග්‍රීසි) | යතුරු ලියනය (සිංහල)<br>දෙනු ලබන වචන 400 ක ඡේදයක් විනාඩියකට වචන 20 ක වේගයෙන් යතුරු ලියනය කිරීම |
| | | යතුරු ලියනය (දෙමළ)<br>දෙනු ලබන වචන 400 ක ඡේදයක් විනාඩියකට වචන 20 ක වේගයෙන් යතුරු ලියනය කිරීම |
| | | යතුරු ලියනය (ඉංග්‍රීසි)<br>දෙනු ලබන වචන 600 ක ඡේදයක් විනාඩියකට වචන 30 ක වේගයෙන් යතුරු ලියනය කිරීම |

**සටහන** : සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් ම අපහැදිලි අත් අකුරු සම්බන්ධයෙන් ලකුණු අඩුකරනු ලැබේ.

මෙම ප්‍රශ්නපත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න, රචනා ප්‍රශ්න හා /හෝ ප්‍රායෝගික ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත.

07. විභාගයේ සියලු විෂයයන් සමත් අපේක්ෂකයින් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයාගේ සිට පහළට ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු එකී විභාගය සඳහා වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය. එසේ වුව ද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකිය.

විභාග ප්‍රතිඵල - අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා මගින් තැපැලෙන් සිදු කරනු ඇත.

**08. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදුකල බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු නම් සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

**09. විභාග ගාස්තු -**

විභාග ගාස්තු රු. 400/- කි. මෙම මුදල **"අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්" නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙන යන ගිණුම් අංක 297100199025039** ට බැර කර ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයක් මඟින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

**10. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 ½" x 12" (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ආ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපැලෙන් **2025 ජූලි මස 18** වැනි දින හෝ ඊට පෙර ලැබෙන පිණිස "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට එවිය යුතුය.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025"** යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. **2025 ජූලි මස 18** වැනි දිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාර ගනු නොලැබේ.

(ඈ) ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරණ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(ඈ) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

11. **විභාගයට පෙනී සිටීම. -** ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර තැපැල් මඟින් නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කල විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් මෙම විස්තර සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, 0112 421 206 හෝ 0112 446 111 දරණ ෆැක්ස් අංකයට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත යොමු කරමින් විමසිය යුතුය. තවද අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාව. -** තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත
ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය
ඇ) වලංගු රියදුරු බලපත්‍රය

13. **විභාගයට ඇතුළත් වීම.**

(අ) සෑම ආකාරයකින් ම සම්පූර්ණ ඉල්ලුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන්ට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම ප්‍රවේශ පත්‍රයේ තබන අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම විභාගයට පෙනී සිටින දින, විභාග ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**සටහන. -** අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

14. මෙම රෙගුලාසිවල සළකා නොමැති කරුණු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

16. **අංක 2223 හා 2021.04.09 දිනැති ගැසට් නිවේදනය මත පදනම්ව '<u>උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා</u>**

**ගැනීමේ විවෘත තරග විභාගය - 2021' සඳහා දැනටමත් අයදුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන් නැවත මෙම විභාගයට අයදුම්පත්‍ර එවීම අවශ්‍ය නොවන අතර, එම ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කල යුතු දිනය වන 2021.05.10 දිනට සුදුසුකම් සම්පූර්ණ නොකල අයදුම්කරුවන්ට නැවත මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමට බාධාවක් නැත.**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්.එස්.සෝමරත්න,<br>
ලේකම්,<br>
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2025 ජුනි මස 06 වැනි දින,<br>
කොළඹ 12,<br>
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

☐

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය:

සිංහල - 1<br>
දෙමළ - 2 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අයදුම්කරන යතුරු ලේඛක තනතුර:

යතුරු ලේඛක (සිංහල) ☐

යතුරු ලේඛක (දෙමළ) ☐

යතුරු ලේඛක (ඉංග්‍රීසි) ☐

(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)

03. පෞද්ගලික තොරතුරු :

3.1 මුලකුරු සමඟ නම: Mr./Mrs./Miss. ............................................................. ............<br>
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) උදා : A.P.K. SIRIWARDANA

3.2 සම්පූර්ණ නම:<br>
........................................................................................................................ ……<br>
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

3.3 සම්පූර්ණ නම :
.................................................................................................................. ……...
(සිංහලෙන්/දෙමළෙන්)

3.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :
..................................................................................................................................

3.5 පදිංචි දිස්ත්‍රික්කය : ..................................................................................................................................

3.6 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :
..................................................................................................................................

3.7 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

3.8 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.9 **2025.06.13** දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින: ☐☐

3.10 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 1 ස්ත්‍රී – 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.11 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක – 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.12 දුරකථන අංකය :

ස්ථාවර : ................................ ජංගම :................................

විද්‍යුත් තැපැල :...............................

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(අ.පො.ස.(සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ සත්‍ය ඡායා පිටපතක් අමුණන්න)

(1) විභාගයේ වර්ෂය හා මාසය : .........
(2) විභාග අංකය: .............................

(3) ප්‍රතිඵල:

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර:

(1) විභාගයේ වර්ෂය හා මාසය :...........

(2) විභාග අංකය:...............................

(3) ප්‍රතිඵල:

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

05. යතුරු ලියනය පිළිබඳ හදාරා ඇති පාඨමාලාව : …………………………………………........
(පාඨමාලාව සමත් සහතිකයේ සහතික කරන ලද සත්‍ය ඡායා පිටපතක් අමුණන්න.)

06. වෙනත් සුදුසුකම්: ..........................................................................................................................................
...............................................................................................................................................

07. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?
(අදාළ කොටුවේ (√ ) ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

'ඔව්' නම් විස්තර සඳහන් කරන්න ..........................................................................................

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර:
විභාග ගාස්තු ගෙවූ බැංකු ශාඛාව: .......................
ලදුපත් අංකය හා දිනය : ...............................
ගෙවූ මුදල: ...................................................

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න<br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) |

09. අයදුම්කරුගේ සහතිකය:

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය විඳ දරාගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

................. ..........................

දිනය අයදුම්කරුගේ අත්සන

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත, ඉදිරිපත් කරනු ලබන .................................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන .................................. දින තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

....................... ..........................

දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :........................................................................

තනතුර :........................................................................

ලිපිනය :........................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය** (දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම .............................. සේවය කරන .................................................... මයා/මිය/මෙනවියට උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන ........................... තනතුරින් මුදාහරින බව ද ඔහුට/ඇයට **2025.06.13** දිනට වයස අවුරුදු 35 ට නොවැඩි බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ...................................... දින අත්සන් කළ බව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සඳහන් කරමින් ඔහුගේ/ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර මේ සමඟ ඉදිරිපත් කරමි.

දිනය :- දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :-

නිල මුද්‍රාව :-

06-96

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025

01. අංක 2088/26 දරන 2018.09.11 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුව **'උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025'** සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් **කොළඹ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට බලය ඇත.

02. සේවා කොන්දේසි :

2.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව බඳවාගනු ලබන අධිකරණ ලඝු ලේඛක සේවයේ නිලධරයන් ආයතන සංග්‍රහයට, මුදල් රෙගුලාසිවලට, අධිකරණ 0 කොමිෂන් සභාව විසින් දැනටමත් නිකුත් කර ඇති සහ කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ, නියෝග සහ විධානයන්ට යටත් වන්නේය.

2.2 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණියට බඳවා ගෙන වසර 05 ක් ගත වීමට පෙර සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

2.3 තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මහහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට බලය ඇත.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුකූලව නිකුත් කරන ලද අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 456 පරිදි උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණියට අදාල ද්විතීක මට්ටම අනුව තනතුරට බැඳී වසර 03 ක් ඇතුලත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා 2025.03.25 දිනැති චක්‍රලේඛය අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණිය සේවයට අදාළ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

වැටුප් කේතය - (MN 2-2025)

වැටුප් පරිමාණය (මාසිකව) - රු.48,470/– 10 x 540- 11 x 630- 10 x 1010- 10 x 1190- රු.82,800/-

අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණියට බඳවාගනු ලබන අයදුම්කරුවන් රු.48,470/ක ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ලබන අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා 2025.03.25 දිනැති චක්‍රලේඛයේ උපලේඛන III පරිදි වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

විශ්‍රාම වැටුප් සහිත බව ඉහතින් දක්වා තිබුණ ද අනාගතයේ බඳවාගනු ලබන අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණියට පත්වන නිලධාරින් සම්බන්ධයෙන් ඔවුන්ට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය හා/හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඉදිරියේ දී ගනු ලබන තීරණයකට ඔවුන් යටත් වන්නේය.

05. සුදුසුකම්:

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) **2025.06.13** දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(I) ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී ගණිතය ඇතුලු විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සහ*

(II) ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල හෝ රජයේ ලියාපදිංචි පුහුණු ආයතනයක ලඝු ලේඛනය සහ යතුරු ලියනය පාඨමාලාවක් සාර්ථකව හදාරා ඉන් සමත්ව තිබීම.

(ඉ) උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බඳවා ගනු ලබන සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

***සැ.යු.*** - සෑම අයදුම්කරුවකු ම තනතුරට අදාළ සියලු සුදුසුකම් **2025 ජුනි මස 13** වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. විභාග පටිපාටිය :-

විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් (03)යුක්ත වේ.

| | *ප්‍රශ්න පත්‍රය* | *මුළු ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු* |
|---|---|---|---|
| 1 | භාෂා හැකියාව (ඉංග්‍රීසි) | 100 | 40 |
| 2 | අභියෝග්‍යතාවය (ඉංග්‍රීසි) | 100 | 40 |
| 3 | ලඝු ලේඛනය හා යතුරු ලියනය (ඉංග්‍රීසි) | 100 | * |

(* පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ලඝු ලේඛනය හා යතුරු ලියන විෂයයේ සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභිමතය අනුව තීරණය කරනු ඇත.)

මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයෙකුට තමන් කැමති එක් මාධ්‍යයකින් පමණක් විභාගයට පෙනී සිටිය හැක.

අයදුම්කරු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන් පමණක් "භාෂා හැකියාව" හා "අභියෝග්‍යතාව" යන ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.

ලඝු ලේඛනය හා යතුරු ලියනය සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පිළිතුරු සැපයිය යුතුය. රාජකාරී කටයුතු සඳහා අපේක්ෂකයා සතු සුදුසුකම හා හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.

**විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | භාෂා හැකියාව (සිංහල/දෙමළ) | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, ලිපි කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර සහ වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| 02 | අභියෝගතාවය (සිංහල/දෙමළ) | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| 03 | ලඝු ලේඛනය හා යතුරු ලියනය (ඉංග්‍රීසි) | ලඝු ලේඛනය (ඉංග්‍රීසි)<br>විනාඩියකට වචන 80 ක අවම වේගයෙන් විනාඩි 05 ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනය කර එය විනාඩියකට වචන 08 ක වේගයෙන් පිටපත් කිරීම.<br><br>යතුරු ලියනය (ඉංග්‍රීසි)<br>දෙනු ලබන වචන 600 ක ඡේදයක් විනාඩියකට වචන 30 ක වේගයෙන් යතුරු ලියනය කිරීම. |

**සටහන :** සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් ම අපහැදිලි අත් අකුරු සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

මෙම ප්‍රශ්නපත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න, රචනා ප්‍රශ්න හා/හෝ ප්‍රායෝගික ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත.

07. විභාගයේ සියලු විෂයයන් සමත් අපේක්ෂකයින් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයාගේ සිට පහළට ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු එකී විභාගය සඳහා වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය. එසේ වුවද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකිය.

විභාග ප්‍රතිඵල. - අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා මගින් තැපෑලෙන් සිදු කරනු ඇත.

08. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් -*
වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදුකල බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු නම් සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

09. *විභාග ගාස්තු -*
විභාග ගාස්තු රු. 400 කි. මෙම මුදල **"අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්" නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙන යන ගිණුම් අංක 297100199025039** ට බැර කර ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයක් මඟින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

10. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 ½" x 12" (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.)

සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැක.

(ආ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් **2025 ජූලි මස 18** වැනි දින හෝ ඊට පෙර ලැබෙන පිණිස "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට එවිය යුතුය.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025"** යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. 2025 ජූලි මස 18 වැනි දිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාර ගනු නොලැබේ.

(ඇ) ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(ඈ) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

11. විභාගයට පෙනී සිටීම - ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර තැපැල් මඟින් නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම්කල විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් මෙම විස්තර සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, 0112 421 206 හෝ 0112 446 111 දරන ෆැක්ස් අංකයට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත යොමු කරමින් විමසිය යුතුය. තවද අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සුදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,
ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

13. විභාගයට ඇතුළත් වීම.

(අ) සෑම ආකාරයකින් ම සම්පූර්ණ ඉල්ලුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන්ට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම ප්‍රවේශ පත්‍රයේ තබන අත්සන සහතික කරවා ගෙන පළමුවෙන් ම විභාගයට පෙනී සිටින දින, විභාග ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**සටහන -** අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

14. මෙම රෙගුලාසිවල සළකා නොමැති කරුණු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

16. **අංක 2269 හා 2022.02.25 දිනැති *ගැසට්* නිවේදනය මත පදනම්ව '<u>උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2022</u>' සඳහා දැනටමත් අයදුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන් නැවත මෙම විභාගයට අයදුම්පත්‍ර එවීම අවශ්‍ය නොවන අතර, එම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කල යුතු දිනය වන 2022.02.25 දිනට සුදුසුකම් සම්පූර්ණ නොකල අයදුම්කරුවන්ට නැවත මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමට බාධාවක් නැත.**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2025 ජුනි මස 06 වන දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මාධ්‍යය
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය:

සිංහල - 1

දෙමළ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. පෞද්ගලික තොරතුරු :

2.1 මුලකුරු සමඟ නම : Mr./Mrs./Miss. ............................................................. ............
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) උදා : A.P.K. SIRIWARDANA

2.2 සම්පූර්ණ නම :
............................................................................................................................ ……
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

2.3 සම්පූර්ණ නම :
........................................................................................................................... ……...
(සිංහලෙන්/දෙමළෙන්)

2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :
.........................................................................................................................

2.5 පදිංචි දිස්ත්‍රික්කය : .........................................................................................................................

2.6 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :
.........................................................................................................................

2.7 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.8 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

2.9 **2025.06.13** දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින: ☐☐

2.10 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 1 ස්ත්‍රී – 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.11 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක – 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.12 දුරකථන අංකය :

ස්ථාවර : ................................ ජංගම :................................

විද්‍යුත් තැපෑල :...............................

03. අධ්‍යාපන සුදුසුකම් :

3.1 අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(අ.පො.ස.(සා.පෙළ) විභාගයේ ප්‍රතිපල ලේඛනයේ සහතික කළ සත්‍ය ඡායා පිටපතක් අමුණන්න)

(1) විභාගයේ වර්ෂය හා මාසය : .........
(2) විභාග අංකය: ..............................
(3) ප්‍රතිඵල: ......................................

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

3.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර:
(1) විභාගයේ වර්ෂය හා මාසය :...........
(2) විභාග අංකය:...............................
(3) ප්‍රතිඵල:.......................................

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

04. ලඝු ලේඛනය පිළිබඳ හදාරා ඇති පාඨමාලාව : ………………………………………….........
(පාඨමාලාව සමත් සහතිකයේ සහතික කරන ලද සත්‍ය ඡායා පිටපතක් අමුණන්න.)

05. වෙනත් සුදුසුකම්: ...........................................................................................................................................
...........................................................................................................................................

06. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?
(අදාළ කොටුවේ (√ ) ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

'ඔව්' නම් විස්තර සඳහන් කරන්න ..........................................................................................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර:
විභාග ගාස්තු ගෙවූ බැංකු ශාඛාව: .......................
ලදුපත් අංකය හා දිනය : ................................
ගෙවූ මුදල: ....................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

08. අයදුම්කරුගේ සහතිකය:

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය විඳ දරාගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

................. ..........................

දිනය අයදුම්කරුගේ අත්සන

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත, ඉදිරිපත් කරනු ලබන .................................................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන .................................. දින තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

....................... ..........................

දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :.........................................................................
තනතුර :.........................................................................
ලිපිනය :.........................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය** (දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම .............................. සේවය කරන .................................................... මයා/මිය/මෙනවියට උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (ඉංග්‍රීසි) III ශ්‍රේණිය තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරණ තනතුරින් මුදාහරින බව ද ඔහුට/ඇයට **2025.06.13** දිනට වයස අවුරුදු 35 ට නොවැඩි බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ..................................... දින අත්සන් කළ බව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සඳහන් කරමින් ඔහුගේ/ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර මේ සමඟ ඉදිරිපත් කරමි.

දිනය :- දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :-

නිල මුද්‍රාව :-

06-97

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**

දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ස්ථානාධිපති - III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ
විවෘත ලිඛිත තරග විභාගය - 2025

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ස්ථානාධිපති තනතුරේ පුරප්පාඩු **106 ක්** පිරවීම සඳහා 2025.07.14 දිනට වයස අවුරුදු 18ට වැඩි සහ 30 ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (ඒ අනුව අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ 2007.07.14 දින හෝ ඊට පෙර හා 1995.07.14 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණි.) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025.07.14 දින වේ. මෙම විභාගය **2025 සැප්තැම්බර්** මස පැවැත්වේ. සියලුම අයදුම්පත් එදිනට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ආයතනික විභාග සංවිධාන ශාඛාව, තැ.පෙ. 1503 කොළඹ. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කිසිම අයදුම්පතක් පුද්ගලික නමට එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ නොකළ යුතුය. අසම්පූර්ණ, අවිධිමත්, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, නිසි පරිදි මුදල් ගෙවා නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් තම අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් නියමිත දිනට පෙර එවිය යුතුය.

මෙම විභාගය පැවැත්වීම සඳහා විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට අපේක්ෂිත නගර හා නගර අංක 1 වැනි උපලේඛනයේ දක්වා ඇත. අයදුම් පතේ ඉහළ ශීර්ෂයේ මෙම නගර අංක ලේඛනයට අනුව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එහෙත් විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති නගරවල අයදුම්කරුවන් ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩිගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම්කොට නොමැත්තේ නම්, විභාගය කොළඹ දී පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ලැබේ.

**1 වැනි උපලේඛනය**

**විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | **01** |
| ගම්පහ | **02** |
| කළුතර | **03** |
| මහනුවර | **04** |
| මාතලේ | **05** |
| නුවරඑළිය | **06** |
| ගාල්ල | **07** |
| මාතර | **08** |
| හම්බන්තොට | **09** |
| යාපනය | **10** |
| මන්නාරම | **11** |
| වව්නියාව | **12** |
| මුලතිව් | **13** |
| කිළිනොච්චිය | **14** |
| මඩකලපුව | **15** |
| අම්පාර | **16** |
| ත්‍රිකුණාමලය | **17** |
| කුරුණෑගල | **18** |
| පුත්තලම | **19** |
| අනුරාධපුරය | **20** |
| පොළොන්නරුව | **21** |
| බදුල්ල | **22** |
| මොනරාගල | **23** |
| රත්නපුර | **24** |
| කෑගල්ල | **25** |

02. අයදුම්පත් කැඳවනු ලබන තනතුර : දුම්රිය ස්ථානාධිපති III ශ්‍රේණිය

03. තනතුරේ රාජකාරී ස්වභාවය :

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ පවත්නා දුම්රිය ස්ථානයන්හි කාර්යයන්ට අදාළව දුම්රිය සාමාන්‍යාධිකාරිගේ නියෝජිතයා ලෙස කටයුතු කරමින් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නිශ්චිතව පවරාදෙනු ලබන පිරිස් පාලනය, මූල්‍ය හා වාණිජ කටයුතු , සම්බන්ධීකරණ කාර්යයන්, මෙහෙයුම් කටයුතු , ප්‍රවේශ පත්‍ර හා ගිණුම් කටයුතු ඇතුළු බහුකාර්යය ස්වරූපයේ කාර්යයන් සහ අධීක්ෂණ කාර්යයන් ඉටු කරන නිලධර ගණයකි.

04. වැටුප් පරිමාණය :

දුම්රිය ස්ථානාධිපති III පෙළ සඳහා අදාළ වන වැටුප් පරිමාණය
(රා.ප.ච. 10/2025 )

රු. 57,810 - 5x890 - 5x1030 - 5x1300 - 10x1340 – රු. 93,810/=

05 (අ) අධ්‍යාපන සුදුසුකම් :

I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් 06 කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් වී තිබීම;

*සහ*

II. අ.පො.ස.(උසස් පෙළ) විභාගයෙන් විෂයයන් තුනකින් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වී තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් සමත් වී තිබීම)

(ආ) කායික සුදුසුකම් :

i. සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

ii. තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

iii. උස අඩි 05 අඟල් 04 කට හා පපුව අඟල් 32 ට නොඅඩු වීම.

iv. 6x 6 අක්ෂි දෘෂ්ටි පරීක්ෂණයකින් සමත් වීම.

(ඇ) වෙනත් සුදුසුකම් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යුක්ත විය යුතුය.

iii. අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ පිරිමි අයදුම්කරුවන් පමණි.

*සටහන* - මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලබන දිනට ඉහත සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

06. බඳවා ගැනීමේ ක්‍රමය :
ඉහත (05) හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා විවෘත ලිඛිත තරග විභාගයක් පවත්වා ලබා ගන්නා කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගනු ලැබේ. අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවති පුරප්පාඩු පමණක් පුරවන අතර, පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු නොකරයි.

07. බඳවා ගැනීමේ පරීක්ෂණයේ විභාග පරිපාටිය :

i. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලැබේ.

ii. විභාග ක්‍රමය :

(අ) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ. (ආ) සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ ඉහත (05) යටතේ සුදුසුකම් ලබා ඇති භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

iii. විභාගයේ විෂයයන් :

(අ) භාෂා හැකියාව

(ආ) අභියෝග්‍යතා පරීක්ෂණය

iv. විෂය නිර්දේශය :

01. භාෂා හැකියාව

කාලය පැය 1½ යි. ලකුණු 100 යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතවේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

01.1වැනි කොටස

මෙම කොටසට රචනයක් හා සාරාංශයක් ලිවීම ඇතුළත්වේ.

01.11 වැනි කොටස

භාෂාව පිළිබඳ අපේක්ෂකයාගේ වැටහීම හා ව්‍යාකරණ පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම පිණිස සැකසුණු ප්‍රශ්න වලින් දෙවැනි කොටස සමන්විත වේ.

02. අභියෝග්‍යතා පරීක්ෂණය - කාලය පැය 01 යි. ලකුණු 100 යි.

අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, බුද්ධිය පිළිබදව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. බහුවරණ ප්‍රශ්නවලින් යුක්ත වන අතර, ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

v. තේරීම් පරිපාටිය :

එක් එක් විෂයකින් ලකුණු 50% ක් බැගින් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් විභාගය සමත් වූ අය සේ සැලකෙන අතර, මෙම විභාගයෙන් විෂයයන් දෙකෙන් ම වැඩි ලකුණු ලබා සමත්වන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමක් සිදු නොකරනු ලැබේ. අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාව අනුව දුම්රිය ස්ථානාධිපති -111 ශ්‍රේණියට පත් කරනු ලැබේ. පත්කරනු ලැබීම සඳහා අපේක්ෂකයින් තෝරා ගනු ලබන්නේ ඉහත 06 යටතේ දක්වා ඇති කරුණුවලට යටත්ව විභාගයේ ඉහළම ලකුණු ලබා ඇති කුසලතා අනුපිළිවෙළට අනුවය.

08. අයදුම්පත් සකස් කිරීමට හා සම්පූර්ණ කිරීමට උපදෙස් :

i. අයදුම්පත A 4 (යතුරු ලියන කඩදාසි) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත ම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතුය.

(අයදුම්පත තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි)

අයදුම්පතේ -

1 වැනි පිටුවේ අංක 01 සිට 05 තෙක් කරුණු ද,

2 වැනි පිටුවේ අංක 06සිට 09 තෙක් කරුණු ද,

3 වැනි පිටුවේ අංක 10 සිට 11 තෙක් කරුණු ද,

4 පිටුවේ අංක 12 සහ 13 අත්සන සහතික කිරීම හා දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය ද ඇතුළත් විය යුතුය.

ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. අයදුම්පත පිළියෙල කර ගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

ii. අදාළ විභාගය සඳහා විභාග ගාස්තුව රු 1,200 කි. එය විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයකින් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම ලදුපතෙහි ඡායා පිටපත් ඉදිරිපත් කිරීම හෝ වෙනයම් ආකාරයට මුදල් ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ. තව ද විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

iii. අයදුම්පත බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ස්ථානාධිපති තනතුරේ - III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත ලිඛිත තරග විභාගය - 2025"** යන්න සහ ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා නගර අංකය සඳහන් කරන්න.

iv. බාහිර අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම.

රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු , රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සිදුකළ යුතුය.

v. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු පුද්ගලයන්ගේ අත්සන් තම ආසන්නතම සේවා ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. මොවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් එවීම අනිවාර්ය වේ.

vi. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.නිවේදනය පළ වී දින 2 ක් 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පතෙහි පිටපත ද ගෙවන ලද විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත ද , ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව, අයදුම් කරන ලද විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය ද සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ඔබගේ ඉහත විස්තර ඇතුළත් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත් තැපෑල මඟින් යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත.

vii. ප්‍රවේශ පත්‍රය ලද වහාම පරීක්ෂා කර බලා නාම සංශෝධන වෙතොත් විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ නාම සංශෝධන සිදු කර ගැනීමට පියවර ගත යුතුය. විභාග ශාලාවේදී නාම සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

viii. විභාග අපේක්ෂකයන් විභාගයට පෙර තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කරවා ගත යුතුය. විභාගයට පළමුවෙන්ම පෙනී සිටින දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

ix. විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත;

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;

III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගත යුතුය. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මෙහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

x. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

xi. විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවේ. *ගැසට් නිවේදනයේ* 7.V ඡේදයට අනුව ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත ලබා දෙනු ඇත. ප්‍රතිඵල ලේඛනයට ඇතුළත් කළයුතු සමත් අයදුම්කරුවන් සංඛ්‍යාව පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා දුම්රිය සාමාන්‍යාධිකාරීගේ ඉල්ලීම මත තීරණය වනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exam.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම හෝ විභාග දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ඇත.

***09 සේවා කොන්දේසි :***

දුම්රිය ස්ථානාධිපති-III තනතුරට බඳවා ගනු ලබන නිලධාරීන් වසර 03 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. දුම්රිය ස්ථානාධිපති -III තනතුරට පත් වූ දින සිට වසර 03 ක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය. පරිවාස කාලය තුළ දුම්රිය ආදර්ශ පාසලේ මාස 06 ක කාලයක් දුම්රිය ස්ථානාධිපති සේවයට අදාළ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. පුහුණුව අවසානයේ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතුය.

10 *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තව දුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයට බැඳුනු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගතයුතු වේ.

iii. තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධානවලටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ආයතන කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධානවලටත් යටත්ව කටයුතු කළ යුතුය. එමෙන්ම විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

11. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජේ.අයි.ඩී.ජයසුන්දර,
දුම්රිය සාමාන්‍යාධිකාරී

2025ක් වූ ජුනි මස 06 වැනි දින
කොළඹ 10
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී.

(මේ අනුව A – 4 කඩදාසිවල දෙපසම භාවිත කරමින් පිළියෙල කරගත් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීමේ නිවේදනය කියවා හොඳින් වටහා ගත යුතුය.)

**ආදර්ශ අයදුම්පත**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

| | | | |
|---|---|---|---|
| විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍ය<br>සිංහල-2<br>දෙමළ-3<br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න) | විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය | නගරය | නගර අංකය |
| පුරවැසිභාවය<br>පරම්පරාවෙන් - 1<br>ලියාපදිංචි වීමෙන් - 2<br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න) | 1 වැනි කැමැත්ත | | |
| | 2 වැනි කැමැත්ත | | |

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ස්ථානාධිපති තනතුරේ - III වන ශ්‍රේණියට**

**බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

**Open Competitive Examination for Recruitment to the Post of Station Master**

**Grade -III, in Sri Lanka Railway Department-2025**

01. සම්පූර්ණ නම :
    i. සිංහලෙන් /දෙමළෙන් : ___________________________
    ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින්:___________________________
    (උදා: HERATH MUDIYANSELAGE PIYAL SILVA)

02. ස්ථිර ලිපිනය :
    i. සිංහලෙන් /දෙමළෙන් : ___________________________
    ii. ඉංග්‍රීසියෙන් : ___________________________

03. දුරකථන අංකය :

ජංගම දුරකතන අංකය : | | | | | | | | | | |

කාර්යාලීය දුරකතන අංකය : | | | | | | | | | | |

04. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

05. ස්ත්‍රී /පුරුෂ භාවය :

ස්ත්‍රී 1

පුරුෂ 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. ජන වර්ගය

සිංහල - 1 / ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2 / ඉන්දියා ද්‍රවිඩ - 3

මුස්ලිම් - 4 / බර්ගර් - 5 / මැලේ - 6 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. පදිංචිය :
i. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : __________ එහි අංකය :
ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : __________
iii. දිස්ත්‍රික්කය :__________

08. උපන් දිනය : වර්ෂය: | | | | | මාසය : | | | දිනය : | | |

2025.07.14 දිනට වයස : අවු : | | | මාස : | | | දින : | | |

09. දැනට සේවය කරන ආයතනය/දෙපාර්තමේන්තුව : ________________________

10. අධ්‍යාපන සුදුසුකම් :
i. අ.පො.ස. (සා.පෙළ)

විභාග අංකය : ___________ වර්ෂය : ______

| අනු අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| I. | | |
| II. | | |
| III. | | |
| IV. | | |
| V. | | |

| අනු අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ii.) අ.පො.ස. (උසස් පෙළ) :

විභාග අංකය :____________ වර්ෂය : ______

| අනු අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| (i.) | | |
| (ii.) | | |
| (iii.) | | |
| (iv.) | | |

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? :
(අදාළ කොටුව තුළ "×" ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

12. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සහ /හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හා තනතුර සඳහා තෝරා ගැනීමෙන් පසු ඉහත කරුණු අනාවරණය වුවහොත් තනතුර සඳහා කරන ලද පත්වීම අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන්වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් පහකිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවා ද මම පුද්ගලිකව දරා ගනිමි.

(ඇ) ................................ දින ...................................................... තැපැල් කාර්යාලයට රු.1200/= ක් ගෙවා ලබාගත් අංක ..........................................දරන ලදුපත මේ සමඟ අමුණා ඇත.

**ලදුපත එහි එක් දාරයකින් නොගැලපෙන සේ අලවන්න. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබාගන්න)**

(ඈ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඉ) තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන නීති රීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

....................................
අයදුම්කරුගේ අත්සන.

දිනය - ...........................

13. අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ....................................................................................මහතා/ මිය/මෙනවිය මම පුද්ගලිකව හඳුනමි. ඔහු/ ඇය .............................. දින ඉහත අත්සන මා ඉදිරිපිට දී තැබූ බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

..............................................
සහතික කරන අයගේ අත්සන

දිනය : .................

සහතික කරන අයගේ සම්පූර්ණ නම : ...................................................................

තනතුර : ................................................

ලිපිනය : ..........................................................................................................

(කරුණාකර නිල මුද්‍රාව තබන්න).

14. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ........................................................................................මහතා/මිය/මෙනවිය ......... .....................................................දෙපාර්තමේන්තුවේ /ආයතනයේ ................................දින සිට ................................දින දක්වා .....................................................................වශයෙන් සේවය කර ඇත. ඔහුට/ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී නැත/ඇත. ඔහුගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ස්ථානාධිපති III ශ්‍රේණිය සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන් /ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බවත් දන්වනු කැමැත්තෙමි.(අදාළ නොවන වචන කපා හරින්න)

......................................
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

දිනය : ...................................

සහතික කරන අයගේ සම්පූර්ණ නම : ..........................................................................................

තනතුර : .......................................................

ලිපිනය : ..............................................................................................................

(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)

06-105

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)

2025 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාක්ෂණ ආයතනවලට සිසුන් බඳවා ගැනීම

2024 වර්ෂයේ හෝ ඊට පෙර අ.පො.ස (උසස් පෙළ) විභාගය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගෙන්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්කරන පිළිවෙල :**

අයදුම්කරුවන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ, උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා **apply.sliate.ac.lk** වෙබ් අඩවිය මගින් පමණක් මාර්ගගතව අයදුම් කළ යුතුය. වෙනත් ඕනෑම ආකාරයකින් අයදුම් කිරීම පිළිගනු නොලැබේ. අයදුම්කරුවන් අන්තර්ජාලය හරහා උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා අයදුම් කිරීමේ දී මෙන්ම අන්තර්ජාලය හරහා තෝරාගත් උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වීමේ දී ඇතුළත්වීමේ මාර්ගෝපදේශ කියවා තේරුම් ගත යුතු අතර, එහි ඇති නීති රීති සහ රෙගුලාසි අනුගමනය කළ යුතුය. ඇතුළත්වීමේ මාර්ගෝපදේශය මාර්ගගත අයදුම්පත සමඟ ලබා ගත හැක.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් පහත වගුවේ පරිදි උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා කාණ්ඩ දෙකක් යටතේ පිරිනමයි. :

| | |
|---|---|
| **කාණ්ඩ - 1**<br>Z ලකුණු මත පදනම් වූ SLIATE අධ්‍යයන පාඨමාලා | HNDA, HNDBA, HNDBF, HNDE (CIVIL), HNDE (MECHANICAL), HNDE (ELECTRICAL & ELECTRONICS) HNDQS, HNDBSE, HNDT(AGRICULTURE.), HNDFT |
| **කාණ්ඩ - 2**<br>ලකුණු දීමේ පටිපාටිය මත පදනම් වූ SLIATE අධ්‍යයන පාඨමාලා | HND IN ENGLISH, HNDIT, HNDM, HNDPM, HNDTHM |

සුදුසුකම් ලත් අපේක්ෂකයින්ට Z අගය මත පදනම් වූ සහ ලකුණුදීමේ පටිපාටිය මත පදනම් වූ පාඨමාලා කාණ්ඩ දෙකෙන් උපරිම අවස්ථා 10 ක් දක්වා ඔවුන්ගේ ප්‍රමුඛතාවය මත පදනම්ව උසස් තාක්ෂණ ආයතන සහ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සංයෝජන තෝරාගත හැක.

උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා (HND) සඳහා වන ප්‍රවේශ සුදුසුකම් **"A"** කොටසේ සහ උසස් තාක්ෂණ ආයතන (**ATIs**) පිළිබඳ විස්තර **"B"** කොටසේ ඇතුළත් කර තිබේ.

සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට රු.1,000/= ක් ගෙවා උසස් තාක්ෂණ ආයතනවල උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා (උසස් තාක්ෂණ ආයතන සහ උසස් ජාතික ඩිප්ලෝමා සංයෝජන) උපරිම 10 ක් ඉහත කාණ්ඩ දෙකෙන් ම ඉල්ලුම් කළ හැක.

**අයදුම්පත් ගාස්තු සෘජුව ම බැංකුවට ගෙවිය යුතුය. CDM යන්ත්‍ර මගින් සිදුකරන ගෙවීම් පිළිගනු නොලැබේ.**

**බැංකු ගෙවීම් කුවිතාන්සියේ ගනුදෙනු යොමු අංකය (TRN) මාර්ගගත අයදුම්පතෙහි සඳහන් කළ යුතුය.**

**2025 ජූලි මස 14 දින හෝ ඊට පෙර මහජන බැංකුව, හයිඩ් පාර්ක් ශාඛාව, කොළඹ 02 හි, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගිණුම් අංක 025-2-001-1-3397613 වෙත ගෙවීම් බැර කළ යුතුය. එම ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් ගෙවීම් සිදුකළ හැකිය.**

**මාර්ගගත අයදුම්පත්‍රය තහවුරු කිරීමෙන් පසු, අයදුම්පත්‍රයේ පද්ධතිය මගින් උත්පාදිත මුද්‍රිත පිටපතක් ලබා ගන්න. ඉහත බාගත කරන ලද අයදුම්පතෙහි අත්සන් කළ අයදුම්පත සහ ගෙවීම් ලදුපත ඔබගේ ප්‍රථම කැමැත්ත සඳහන් කර ඇති උසස් තාක්ෂණ ආයතනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු වේ.**

මෙම ක්‍රියාවලිය තුළ දී සහ ඉන්පසුව අයදුම්පතේ තත්ත්වය කුමක්දැයි අප වෙත ලබා දී ඇති විද්‍යුත් තැපැල් ලිපිනය මගින් හෝ ජංගම දුරකථන ඔස්සේ හෝ තැපැල් මගින් අයදුම්කරුට දන්වනු ලැබේ.

අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය වන **2025 ජූලි මස 14** වැනි දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලැබේ.

**අවසාන දිනයෙන් පසුව, තෝරාගත් අයදුම්කරුවන්ට සති දෙකක් ඇතුළත පද්ධතිය හරහා තෝරාගත් උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචිය තහවුරු කරන ලෙස විද්‍යුත් තැපෑලෙන් / කෙටි පණිවිඩ සේවාව (SMS) මගින් දැනුම් දෙනු ලැබේ. ලබා දී ඇති කාල සීමාව තුළ අයදුම්කරු මාර්ගගත පද්ධතිය හරහා ලියාපදිංචිය තහවුරු නොකරන්නේ නම්, ඔහු/ඇය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙ හි කිසිදු උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා නැවත සලකා බලනු නොලබන අතර, ඔහුගේ/ ඇයගේ අයදුම් පත්‍රය අවලංගු වේ.**

**පාඨමාලා පවත්වනු ලබන ක්‍රමය :**

- **පූර්ණ කාලීන පාඨමාලා**
- **අර්ධ කාලීන පාඨමාලා (සති අන්ත)**

**ඉගැන්වීමේ මාධ්‍ය - ඉංග්‍රීසි**

අර්ධ කාලීන පාඨමාලා අදාළ ක්ෂේත්‍රයන් හි රැකියාවේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණක් පවත්වනු ලැබේ.

<u>පාඨමාලා ගාස්තු :</u>

පූර්ණ කාලීන (Full-Time) පාඨමාලා ගාස්තු - නොමිලේ.

එක් අධ්‍යයන සමාසිකයක් වෙනුවෙන් අර්ධ කාලීන පාඨමාලා ගාස්තු පහත සඳහන් පරිදි වේ. :-

| | |
|---|---|
| **උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව – HNDA** | **රු. 17,000.00** |
| **උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමාව – HND in English** | **රු. 17,000.00** |
| **උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව – HNDIT** | **රු. 30,000.00** |
| **උසස් ජාතික ව්‍යාපෘති කළමනාකරණය ඩිප්ලෝමාව – HNDPM** | **රු. 20,000.00** |
| **අර්ධ කාලීන පාඨමාලා සඳහා ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතු ගාස්තුව** | **රු. 10,000.00** |

**ලියාපදිංචිය :**

ලියාපදිංචිය සිදුකරන අවස්ථාවේ දී අවශ්‍ය අධ්‍යාපනික සහ අනෙකුත් අවශ්‍ය ලියකියවිලිවල මුල්පිටපත් සහ සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

**නේවාසිකාගාර පහසුකම් :**

පහත සඳහන් උසස් තාක්ෂණ ආයතනයන් හි ඉල්ලීම මත පමණක් පූර්ණ කාලීන සිසුන් සීමිත සංඛ්‍යාවක් සඳහා නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබේ.

- දෙහිවල සහ ගම්පහ උසස් තාක්ෂණ ආයතන - සිසුවියන් සඳහා පමණක්
- අම්පාර සහ කොළඹ උසස් තාක්ෂණ ආයතන - සිසුන් සහ සිසුවියන් සඳහා

"A" කොටස

**උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා සඳහා ප්‍රවේශ සුදුසුකම්**

**01. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව** (HNDA)

**1.1 පූර්ණ කාලීන - වසර 4 ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

**වාණිජ විෂය ධාරාව යටතේ ගිණුම්කරණ විෂය** ද සහිතව අ.පො.ස (උ/පෙළ) විභාගය එකවර සමත් වී තිබීම;

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**1.2 අර්ධ කාලීන - වසර 4 ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i.) **වාණිජ විෂය ධාරාව යටතේ ගිණුම්කරණ විෂය** ද සහිතව අ.පො.ස (උ/පෙළ) විභාගය එකවර සමත් වී තිබීම.;

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

*සහ*

අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතනයක/රාජ්‍ය ව්‍යවසායක/පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකු) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේදී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

*හෝ*

(ii) අ.පො.ස (උ/පෙළ) විභාගය එකවර සමත් වීම;

*සහ*

කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) විසින් පවත්වනු ලබන පහත සඳහන් ඇති ඕනෑම සහතික පත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

A. ගණකාධිකරණ ක්ෂේත්‍රයේ උසස් ජාතික ඩිප්ලෝමාව.

B. ගණක ශිල්පය පිළිබඳ ජාතික සහතිකය.

C. ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය.

D. ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය;

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම;

*සහ*

අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතනයක/රාජ්‍ය ව්‍යවසායක/පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකු) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**සටහන 1:**

පහත සඳහන් සුදුසුකම් එකක් හෝ කිහිපයක් ඇති **වාණිජ විෂය ධාරාවේ** ඕනෑම උසස් ජාතික ඩිප්ලෝමා අර්ධ-කාලීන අයදුම්කරුවෙකු අනෙකුත් ප්‍රවේශ අවශ්‍යතා සපුරාලන්නේ නම් සහ උසස් තාක්ෂණ ආයතනවල ධාරිතාව තිබේ නම්, පළමු වසරෙන් නිදහස් කර දෙවන වසරට බඳවා ගනු ලැබේ.

(i) SLIATE විසින් පවත්වනු ලබන ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර මූල්‍ය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම.

(ii) කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් තිබීම.

(iii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වනු ලබන ව්‍යාපාර මට්ටම I සහ II හෝ විධායක මට්ටම හෝ CAB I සහ CAB II හෝ පදනම් සහ අන්තර්මාධ්‍ය මට්ටම හෝ බලපත්‍රලාභී I සහ II සම්පූර්ණ කිරීම.

(iv) වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CIMA – UK) I කොටස සහ II කොටස සම්පූර්ණ කිරීම.

(v) සහතිකලත් වරලත් ගණකාධිකරණ ආයතනය (ACCA-UK) I කොටස සහ II කොටස සම්පූර්ණ කිරීම.

(vi) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) සම්පූර්ණ කිරීම.

(vii) සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CMA-Sri Lanka) විසින් පවත්වනු ලබන ආශ්‍රිත සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ විභාගය (ACMA) සමත්ව තිබීම.

සටහන **2 :**

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 ප්‍රකාරව, බඳවා ගැනීමේ පටිපාටියන්හි දී, උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි, පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජවේදී උපාධි සාමාන්‍ය සාමාර්ථයකට විකල්ප අධ්‍යාපනික සුදුසුකමක් ලෙස පිළිගනු ලැබේ.**

**02.** **උසස් ජාතික ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමාව** (HNDBA)

**පූර්ණ කාලීන - වසර** 2 ½ **ක්**

**03.** **උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමාව (**HNDBF)

**පූර්ණ කාලීන - වසර** 2 ½ **ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

**වාණිජ විෂය ධාරාව** යටතේ එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

**04.** **උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්)**

HNDE (Civil) - **පූර්ණ කාලීන - වසර 3 ½ ක්**

**05.** **උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි හා විද්‍යුත් )**

HNDE (Electrical and Electronics) - **පූර්ණ කාලීන - වසර 3 ½ ක්**

**06.** **උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික)**HNDE (Mechanical)

**පූර්ණ කාලීන - වසර 3 ½ ක්**

**07.** **උසස් ජාතික ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමාව** HNDQS

**පූර්ණ කාලීන - වසර 2 ½ ක්**

**08.** **උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමාව** HNDBSE

**පූර්ණ කාලීන - වසර 3 ½ ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**භෞතික විද්‍යා විෂය ධාරාවෙන්** එකවර අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් වී තිබීම;

(රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය)

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**09. උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (HND in English)**

**9.1 පූර්ණ කාලීන - වසර 2 ½ යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(a) **ඕනෑම විෂය ධාරාවකින්** එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම;

(සාමාන්‍ය ඉංග්‍රීසි ප්‍රධාන විෂයයන් තුනෙන් එකක් ලෙස නොසැලකේ.)

*සහ*

(b) අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් සහ ගණිතය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබාතිබීම;

*හෝ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍ය විෂයය සඳහා සහ ගණිතය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබාතිබීම.

**9.2 අර්ධ කාලීන - වසර 2½ යි.**

9.1 හි ඉහත සුදුසුකම්වලට අමතරව, අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක / රාජ්‍ය ව්‍යවසායක / පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක නියුක්ත (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**10. උසස් ජාතික ආහාර තාක්ෂණ ඩිප්ලෝමාව** (HNDFT)

**පූර්ණ කාලීන - වසර 2½ යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන්** එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම;

**11. උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව** (HNDIT)

11.1 **පූර්ණ කාලීන - වසර 2½ යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**ඕනෑම විෂය ධාරාවකින්** එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**11.2 අර්ධ කාලීන - වසර 2½ යි.**

**11**.1 හි ඉහත සුදුසුකම්වලට අමතරව, අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක / රාජ්‍ය ව්‍යවසායක / පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**12. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාව** (HNDM) **පූර්ණ කාලීන - වසර 3 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i.) **ඕනෑම විෂය ධාරාවකින්** එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

අ.පො.ස (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

*හෝ*

**(ii)** කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගිණුම්කරණ කාර්මික ශිල්පීන් සඳහාවන ජාතික සහතිකය හෝ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය

(රාජ්‍ය පරිපාලනය / අලෙවිකරණය);

**සහ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

**13. උසස් ජාතික ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමාව** (HNDPM)

**13.1 පූර්ණ කාලීන - වසර 2½ යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**ඕනෑම විෂය ධාරාවකින්** එකවරක දී අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

13.2 **අර්ධ කාලීන - වසර 2½ යි.**

**13**.1 හි ඉහත සුදුසුකම්වලට අමතරව, අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක / රාජ්‍ය ව්‍යවසායක / පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**14. උසස් ජාතික තාක්ෂණ (කෘෂිකර්ම) ඩිප්ලෝමා පාඨමාලාව** (HNDT – Agriculture) **පූර්ණ කාලීන - වසර 3 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i.) **ජීව විද්‍යාව විෂය ධාරාවෙන්** එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

(ජීව විද්‍යාව සහ රසායන විද්‍යාව සමඟ භෞතික විද්‍යාව හෝ කෘෂිකර්මය විෂයයන් ඇතුළත්ව)

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

*හෝ*

(ii.) **ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් ඇතුළත්ව, ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාවෙන්** එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**15. උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව** (HNDTHM) **පූර්ණ කාලීන - වසර 3 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**"B"** කොටස

උසස් තාක්ෂණ ආයතනවල (ATIs) නම්, ලිපිනයන්, දුරකථන අංක සහ

උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා [පූර්ණ කාලීන (FT) සහ අර්ධ කාලීන (PT) ]

| *අංකය* | *උසස් තාක්ෂණ ආයතනයේ නම* | *ලිපිනය* | *දුරකථන අංක* | *පවත්වනු ලබන පාඨමාලා* |
|---|---|---|---|---|
| 01 | හාඩි උසස් තාක්ෂණ ආයතනය, අම්පාර | මහාචාර්ය එවන් ඒ හාඩි මාවත, අම්පාර. | 063-2222056<br>063-2223035 | HNDT (Agriculture)(FT), HNDA (FT), HNDM(FT), HNDIT (FT), HNDTHM(FT), HND in English (FT),<br>HNDA (PT), HND in English (PT), HNDIT (PT) |
| 02 | උසස් තාක්ෂණ ආයතනය, අනුරාධපුරය. | අක්කර 111, අනුලා මාවත, පන්ඩුලගම, අනුරාධපුරය. | 025-2234417 | HNDIT(FT), HNDA (FT), HND in English (FT),<br>HNDIT(PT) HNDA (PT), HND in English (PT) |
| 03 | උසස් තාක්ෂණ ආයතනය, බදුල්ල. | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල. | 055-2230218<br>055-2223818 | HNDIT (FT), HNDA (FT), HNDM(FT), HND in English (FT), HNDTHM(FT),<br>HNDIT (PT), HNDA (PT),HND in English (PT) |

| අංකය | උසස් තාක්ෂණ ආයතනයේ නම | ලිපිනය | දුරකථන අංක | පවත්වනු ලබන පාඨමාලා |
|---|---|---|---|---|
| 04 | උසස් තාක්ෂණ ආයතනය, මඩකලපුව. | කෙලින් වීදිය, කෝවිල් කුලම්, නැගෙනහිර, ආරයම්පති, මඩකලපුව. | 065-2247519<br>065-2247470 | HNDIT (FT), HNDA (FT),<br>HND in English (FT), HNDA (PT),<br>HND in English (PT), HNDIT(PT) |
| 05 | උසස් තාක්ෂණ ආයතනය, කොළඹ. | අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ- 15. | 011-2521152<br>011-2521282 | HNDE (Civil)(FT),HNDE(Mechanical)(FT),<br>HNDE (Electrical & Electronics)(FT)<br>HNDQS(FT), HNDBSE(FT) |
| 06 | උසස් තාක්ෂණ ආයතනය, දෙහිවල. | අංක 51, වෛද්‍ය පාර, දෙහිවල | 011-2738349 | HNDIT (FT), HNDA (FT), HNDM (FT),<br>HNDBA (FT), HND in English (FT),<br>HNDBF(FT), HNDTHM(FT),<br>HNDA (PT), HND in English (PT) |
| 07 | උසස් තාක්ෂණ ආයතනය, ගාල්ල. | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමණ, ගාල්ල. | 091-2246179 | HNDE (Civil)(FT),HNDE(Mechanical)(FT),<br>HNDE (Electrical & Electronics)(FT)<br>HNDQS(FT), HNDIT (FT), HNDT(Agriculture) (FT),<br>HNDA (FT), HNDM(FT), HNDTHM(FT),-<br>HNDBA(FT), HND in English (FT),<br>HNDA (PT), HNDIT (PT), HND in English (PT) |
| 08 | උසස් තාක්ෂණ ආයතනය, ගම්පහ. | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ. | 033-2287519<br>033-2292544 | HNDT (Agriculture) (FT), HNDIT (FT),<br>HNDFT(FT),HNDA (FT),<br>HNDA (PT), HNDIT (PT),<br>HND in English (PT) |
| 09 | උසස් තාක්ෂණ ආයතනය, යාපනය. | අංක 665 /2 වෙරළ පාර, ගුරුනගර්, යාපනය. | 021-2222595<br>021-2229803 | HNDE (Civil)(FT) , HNDE<br>(Electrical & Electronics)(FT),<br>HNDA (FT), HND in English (FT),<br>HNDQS(FT), HNDM (FT), HNDIT (FT),<br>HNDIT (PT), HNDA (PT) ,<br>HND in English (PT), HNDPM (PT) |
| 10 | උසස් තාක්ෂණ ආයතනය, මහනුවර. | අංක. 16, කැප්පෙටිපොළ මාවත, මහනුවර. | 081-2232097<br>081-2226644 | HNDIT (FT), HNDA (FT), HNDM(FT),<br>HNDBA(FT), HND in English (FT),<br>HNDTHM (FT),<br>HNDA (PT),HND in English (PT), HNDIT (PT) |
| 11 | උසස් තාක්ෂණ ආයතනය, කෑගල්ල. | බණ්ඩාරනායක මාවත, කෑගල්ල. | 035-2221297<br>035-2221713 | HNDIT(FT), HNDA(FT), HND in English(FT),<br>HNDPM(FT)<br>HNDA (PT), HND in English (PT) |

| අංකය | උසස් තාක්ෂණ ආයතනයේ නම | ලිපිනය | දුරකථන අංක | පවත්වනු ලබන පාඨමාලා |
|---|---|---|---|---|
| 12 | උසස් තාක්ෂණ ආයතනය, කුරුණෑගල. | 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල. | 037-2229583<br>037-2224911 | HNDIT(FT),HNDA(FT),HNDM(FT),<br>HND in English (FT), HNDTHM(FT)<br>HNDIT (PT), HNDA (PT), HND in English (PT) |
| 13 | උසස් තාක්ෂණ ආයතනය, මන්නාරම. | උයිලන්කුලම මන්නාරම. | 023-3122555<br>076-7966111 | HND in English (FT),<br>HNDIT (FT) |
| 14 | උසස් තාක්ෂණ ආයතනය, නාවලපිටිය. | හයින්ෆෝඩ් වත්ත මානාකන්ද නාවලපිටිය. | 077-6594248 | HNDTHM(FT), HNDM(FT), HNDBF (FT)<br>HND in English (FT), HNDIT (FT),<br>HND in English (PT)<br>HNDIT (PT) |
| 15 | උසස් තාක්ෂණ ආයතනය, රත්නපුරය. | නව නගරය, රත්නපුරය. | 045-2231492<br>045-2231493 | HNDIT(FT),HNDA(FT),<br>HNDA (PT), HND in English (FT),<br>HND in English (PT) |
| 16 | උසස් තාක්ෂණ ආයතනය, සම්මන්තුරය. | උසස් තාක්ෂණ ආයතන මාවත, සම්මන්තුරය. | 067-2261304 | HNDIT (FT),HNDA (FT), HND in English (FT),<br>HNDM (FT)<br>HNDIT (PT),HNDA (PT), HND in English (PT) |
| 17 | උසස් තාක්ෂණ ආයතනය, තංගල්ල. | යාය වත්ත, නොටොල්පිටිය, තංගල්ල. | 047-2241845<br>047-2241846 | HNDIT (FT), HNDA (FT), HND in English (FT) |
| 18 | උසස් තාක්ෂණ ආයතනය, ත්‍රිකුණාමලය. | කින්නියා පාර, වරෝතය නගර්, ත්‍රිකුණාමලය. | 026-2223232 | HNDIT (FT), HNDA (FT), HND in English (FT),<br>HNDIT (PT), HNDA (PT), HND in English (PT) |
| 19 | උසස් තාක්ෂණ ආයතනය, වවුනියාව. | A9 පාර වෙප්පන්කුලම ඕමන්තෙයි, වවුනියාව. | 024-2052733<br>077-6162010 | HNDA (FT), HND in English (FT),<br>HNDA (PT), HND in English (PT), HNDIT (PT),<br>HNDIT (FT) |

සටහන :

01. අයදුම්කරු අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයට පෙර අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

02. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවතින උසස් තාක්ෂණ ආයතන මගින් පවත්වනු ලබන වසර තුනක් හෝ ඊට වැඩි කාලයක් සහිත පූර්ණකාලීන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක් හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත (වරින්වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතනයකට ප්‍රවේශ වීම සඳහා සුදුසුකම් නොලබයි.

වසර තුනක් හෝ ඊට වැඩි කාලයක් සහිත පූර්ණකාලීන උසස් ජාතික ඩිප්ලෝමා (**HND**) පාඨමාලා

(i) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව – (HNDA)
(ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) HNDE (Civil)
(iii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි හා විද්‍යුත් ) HNDE (Electrical & Electronics)
(iv) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික) HNDE (Mechanical)
(v) උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDBSE)
(vi) උසස් ජාතික තාක්ෂණ (කෘෂිකර්ම) ඩිප්ලෝමා පාඨමාලාව (HNDT – Agriculture)
(vii) උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාව (HNDM)
(viii) උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDTHM)

03. පූර්ණ කාලීන පාඨමාලා සඳහා බඳවා ගැනීමේ දී වයස අවුරුදු 23 ට අඩු අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. එමෙන් ම, 2024 වර්ෂයේ අ.පො.ස.(උ. පෙළ) විභාගය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයදුම්කරුවන්ට ද ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

04. යම් උසස් තාක්ෂණ ආයතනයක නියමිත පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා, එම අධ්‍යයන පාඨමාලාවට අවම වශයෙන් සිසුන් 50 ක් ලියාපදිංචි විය යුතුය. යම් පාඨමාලාවක් ආරම්භ කිරීමට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක, එම සිසුන් එම පාඨමාලාවම පවත්වනු ලබන ආසන්නම උසස් තාක්ෂණ ආයතනය වෙත ස්ථාන මාරු කරනු ලැබේ. මේ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

05. සියලුම පූර්ණ කාලීන පාඨමාලා හදාරන සිසුන්, සතියේ දිනවල සහ අවශ්‍ය වුවහොත් සති අන්ත දිනවල ද දේශන සඳහා සහභාගී විය යුතුය.

06. අර්ධකාලීන පාඨමාලා සති අන්තයේ පවත්වනු ලැබේ.

07. පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා පවත්වනු ලබන්නේ ප්‍රධාන වශයෙන් දේශනශාලාගතව (පන්ති මට්ටමින්) වේ. කෙසේ වෙතත් අවශ්‍යතාවය අනුව පන්ති කාමර තුළ දේශන පැවැත්වීම මෙන් ම මාර්ගගතව දේශන පැවැත්වීම ද සිදු කරනු ලැබේ.

08. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (HNDA) (පූර්ණ කාලීන) පාඨමාලාවේ පළමු වසර හා දෙවන වසරවල අධ්‍යයන කටයුතු සතියේ දිනවල දී පමණක් පවත්වනු ලැබේ. මෙම පාඨමාලාවේ තුන්වන හා හතරවන වසර සඳහාවන දේශන සති අන්තයේ දී පැවැත්වේ.

09. පූර්ණ කාලීන පාඨමාලාවල සිසුන් අවම වශයෙන් මාස 06 ක කාලයක් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රායෝගික පුහුණුවක් ලබා ගත යුතුය. අර්ධකාලීන සිසුන් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් මාස 6 ක ව්‍යාපෘතියක්/ කර්මාන්ත පුහුණුවක් ලබාගත යුතුය.

10. අර්ධ කාලීන අයදුම්කරුවන් අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටිය යුතුය.

11. **යම් සිසුවෙකු පූර්ණ කාලීන පාඨමාලාවකට තෝරාගැනීමෙන් පසුව වෙනත් කිසිදු උසස් තාක්ෂණ ආයතනයක් වෙත කිසිදු හේතුවක් මත ස්ථාන මාරු කරනු නොලැබේ.**

12. ඕනෑම උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී ඇති සිසුන්ට කිසිදු ගාස්තුවකින් තොරව අදාළ ආයතනය විසින් ලබා දී ඇති ලියාපදිංචි වීමේ අවසන් දිනයේ සිට දින 60 ක් ඇතුළත ඔවුන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීමට අවසර දෙනු ලැබේ. ශිෂ්‍ය ලියාපදිංචිය සඳහා අවසාන දිනය පාඨමාලා සමාරම්භක/ ශිෂ්‍ය දිශානත වැඩසටහනකට පෙර වේ.

13. (i) දින 60 කට පසුව ලියාපදිංචිය අවලංගු කරන සිසුන්ගෙන් රැඳී සිටි කාලය සඳහා මසකට රු.5,000.00 ක් බැගින් අයකෙරේ. උපරිමය රු.30,000.00 ක් මාස හයක් හෝ ඊට වැඩි කාලයකට පසු ලියාපදිංචිය අවලංගු කරන සිසුන්ගෙන් අයකෙරේ.

(ii) අර්ධකාලීන පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි කිරීමේ දී, රුපියල් 10,000.00 ක් ආපසු ගෙවිය හැකි මූලික මුදල් තැන්පතුව ලෙස අය කරනු ලබන අතර, එය පාඨමාලාව අවසානයේ ආපසු ගෙවනු ලැබේ. ශිෂ්‍යයා පාඨමාලාව අවසන් කිරීමට පෙර පාඨමාලාව හැර ගියහොත්, මෙම තැන්පතුව ආපසු ගෙවනු නොලැබේ. ලියාපදිංචියේ දී සම්පූර්ණ ගාස්තුව එකවර ගෙවන අර්ධකාලීන අයදුම්කරුවන් හට 10% ක වට්ටමක් ලබා දෙනු ඇත.

14. සතියේ දිනවල සහ සති අන්ත දිනවල පූර්ණ කාලීන හා අර්ධ කාලීන සිසුන් සඳහා සමාසික අවසාන වාර විභාග පවත්වනු ලැබේ.

15. අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස.(සා.පෙළ) විභාග පාලනය වී තිබිය යුත්තේ, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙනි.

16. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති ඕනෑම අයදුම්කරුවකුගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

17. 2025 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාකෂණ ආයතන වෙත සිසුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

18. උසස් තාක්ෂණ ආයතනවල පවතින ආසන ධාරිතාව මත පදනම්ව බඳවා ගැනීම් සිදුකෙරේ.

19. මාර්ගගතව අයදුම්පත් යොමු කිරීමට පහසුකම් නොමැති සිසුන්ට එම සේවාව ලබාගැනීම සඳහා ළඟම ඇති උසස් තාක්‍ෂණ ආයතනය වෙත පැමිණිය හැක.

20. අයදුම්කරුවන් විසින් උසස් තාක්ෂණ ආයතන සහ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා අයදුම්කිරීමේ දී තම පදිංචි ස්ථානයට ආසන්නතම උසස් තාක්ෂණ ආයතනය වෙත අයදුම් කිරීම සුදුසු වේ.

21. වැඩිදුර තොරතුරු සඳහා **www.sliate.ac.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025 ජූලි මස 14 දින වේ.**

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය
**(SLIATE)**

**අංක 53 A**
**වෛද්‍ය පාර**
**දෙහිවල.**

**06-75**